# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර - 2018

## අපරාධ නීතිය
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07

<u>අනිවාර්ය පළමු ප්‍රශ්නය ද ඇතුළුව</u> ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. හේතු දක්වමින් පහත දැක්වෙන අවස්ථාවලට කෙටි පිළිතුරු සපයන්න. එසේම දණ්ඩ නීති සංග්‍රහයේ උචිත ප්‍රතිපාදන හා විනිශ්චිත තීරණ උපුටා දැක්වීම අවශ්‍ය වේ.

(i). H.N.G. ප්‍රනාන්දු විනිසුරු විසින් *රජය එදිරිව සෝමපාල* (1969) 72 නව නීති වාර්තා 121, යන නඩුවේදී ලබා දුන් තීරණය සුවිශේෂී වන්නේ ඇයි?

(ii). යුටෝපියා විශ්වවිද්‍යාලයේ සිසුන් විසින් සංගීත සන්ධ්‍යාවක් සංවිධානය කරයි. උත්සවය අතරතුර දී උපාධි අපේක්ෂකයෙකු වන සුමන් පැණි බීම බෝතලයක් ගොඩනැගිල්ල දෙසට විසිකර එහි වීදුරු කඩා දමයි. සුමන් විසින් සිදු කර ඇති වරද කුමක්ද?

(iii). යුටෝපියා විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙකු වන සුමන් හට විශ්වවිද්‍යාලයට කොට කලිසම් හැඳ පැමිණීමේ පුරුද්දක් පවතී. අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බහුතර ශිෂ්‍යයන්, විශේෂයෙන්ම කාන්තා ශිෂ්‍යාවන් මෙය අනුමත නොකරයි. කොට කලිසම් නොඇඳින ලෙසට කරන ලද ඉල්ලීම් වලට ඇහුම්කන් නොදී පුරුද්දක් ලෙස එය සුමන් දිගටම කරගෙන යයි. සුමන් විසින් කිසියම් වරදක් සිදු කර ඇත්ද?

(iv). රාජා සහ රාණි කාර්යාලයක සගයන් වෙති. රාජා අශ්ලීල වචන යොදාගනිමින් රාණිට කෙටි පණිවිඩ යවයි. රාජාට කිසියම් වරදක් සඳහා චෝදනා නැගිය හැකිද?

(v). දුම්රිය එන්ජින් රියදුරුවරයෙකු වන රුවන් අනෙක් අය වැඩවර්ජනයක යෙදී සිටියදී සේවයට වාර්තා කරයි. ඔහු රාජකාරි කිරීම සඳහා දුම්රියට ගොඩවන විට එක්තරා කණ්ඩායමක් කෑගසමින් ඔහු දෙසට පැමිණෙනු ඔහු දකී. ඔහු දුම්රියෙන් බැස දිවීමට පටන් ගනියි. එම කන්ඩායම ඔහුව ලුහුබැඳ ඒමත් සමඟම ඔහු ගලක් ගෙන ඔවුන් වෙත විසි කළ අතර එම පහර එහි සිටගෙන සිටි කුඩා පිරිමි දරුවකුට වැදුණි. එමගින් දරුවාගේ හිස් කබලේ බිඳීමක් ඇති විය. රුවන්ට ගත හැකිව තිබෙන විකල්ප විත්තිවාචක මොනවාද? එසේම වඩාත් සුදුසු විත්තිවාචකය කුමක්ද?

02. සුමනා පහළොස් හැවිරිදි ශිෂ්‍යාවකි. ඇය වැසි දිනයක සෙනග පිරුණු බස් රියක පාසල් යමින් සිටියදී නිහාල් ඇයගේ ශරීරය ස්පර්ශ කරයි. බියට පත් වූ සුමනා බසයෙන් බැස ත්‍රිරෝද රථයක් නවතා එයට ගොඩ විය. නිහාල්ද බසයෙන් බැස එම ත්‍රිරෝද රථය තුළටම පැන ඇතුළු විය. ඇයට කෑගැසීමට ඉඩ ලබා නොදෙමින් නිහාල් ඇයගේ මුඛය වසයි. ඇයගේ දැගලීම තිබියදීම ත්‍රිරෝද රථය හුදෙකලා ප්‍රදේශයක් පසු කරමින් වෙනත් දිශාවකට ගමන් කරන ලදී. පැය භාගයකට පසු සුමනාව රථයෙන් පිටතට තල්ලු කරන ලදී. සිහිමද ගතියෙන් පාරේ පැත්තක වැටී සිටියදී ඇයව ගම්වාසීන් විසින් සොයාගන්නා ලදී. ඇයගේ ශරීරයේ සීරීම් හෝ තුවාල පෙනෙන්නට නොතිබුණු නමුත් ඇයගේ පාසල් නිල ඇඳුමේ පහළ කොටසේ ලේ පැල්ලම් දක්නට ලැබුණි. පසුව ත්‍රිරෝද රථ රියැදුරු නිහාල් ගේ මිතුරකු වන විමල් ලෙස පොලිසිය විසින් හඳුනා ගන්නා ලදී.

දණ්ඩ නීති සංග්‍රහයේ උචිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීරණ උපුටා දක්වමින් නිහාල් සහ විමල් ගේ අපරාධ වගකීම සාකච්ඡා කරන්න.

3. සුනිමල්ට තම ගම් ප්‍රදේශයේ සිල්ලර බඩු වෙළඳසැලක් හිමිව තිබුණු අතර කමල් එහි එක් පාරිභෝගිකයෙකු විය. කමල් ණයට භාණ්ඩ මිලදී ගැනීම් කළ අතර සිද්ධිය වූ දිනය වන විට කමල් විසින් සුනිමල්ට සැලකිය යුතු ගණනක ණය හිඟයක් විය. සිද්ධිය වූ දිනයේ දී කමල් සුනිමල්ගේ වෙළෙඳසැලට පැමිණ නිවසට අවශ්‍ය භාණ්ඩ කිහිපයක් ඉල්ලා සිටි නමුත් හිඟ ණය මුදල් පිය වන තුරු කිසිවක් ලබා නොදෙන බව පවසමින් සුනිමල් භාණ්ඩ ලබාදීම ප්‍රතික්ෂේප කළේය. කතාබහ උණුසුම් වාදයකට පත්වූ අතර එකිනෙකා දබර වෙමින් වටපිටාවේ තිබූ ද්‍රව්‍ය භාවිතා කරමින් එකිනෙකාට පහර දීමට පටන් ගත්තේය. එම ස්ථානයේ අවට සිටි අනෙකුත් පාරිභෝගිකයන්ට මෙම ගැටුම නතර කිරීමට සිදු විය. සුනිමල් සුළු තුවාල ලැබූ නමුත් කමල් දැඩි ලේ වහනය වීමකින් යුතුවූ අතර දෙදෙනාම රෝහල වෙත රැගෙන යන ලදි. පැය කීපයකට පසුව කමල් සිය තුවාල හේතුවෙන් මිය ගියේය.

පහත එකිනෙකට වෙනස් අවස්ථා දෙකේදී සුනිමල් විසින් සිදුකර ඇති වරද දණ්ඩ නීති සංග්‍රහයේ අදාල ප්‍රතිපාදන (නිශ්චිත පාදයක් (limb) තිබෙ නම් එය ද ඇතුළත් කරමින්) හා නඩු තීරණ නීතිය උපුටා දක්වමින් සලකා බලන්න.

(i) කමල් මෑතදී හර්නියා සැත්කමකට ලක් වූ නමුත් තුවාලය සම්පූර්ණයෙන්ම සුව වී නොමැත. මරණයට හේතුව වූයේ ශල්‍යකර්මය සිදුකරන ලද ස්ථානයටම කරන ලද දැඩි ප්‍රහාරය බව මරණ පරීක්ෂණ වාර්තාවෙන් අනාවරණය කර තිබේ.

(ii) කමල් ගේ කලවා ප්‍රදේශයේ ගැඹුරු කැපුම් තුවාලයක් වූ අතර මරණ පරීක්ෂණ වාර්තාවට අනුව කැඩුණු වීදුරු බෝතලයක් යොදාගෙන පහරදීමෙන් ප්‍රධාන ධමනියක් සිදුරු වී එමගින් ඇති වූ ගැඹුරු කැපුම් තුවාලය නිසා ඇති වූ අධික ලේ වහනය මරණයට හේතුව වී තිබේ.

04. මධ්‍යම පළාත් තුළ ඖෂධ සමාගම් නියෝජිතයෙකු ලෙස නිගම් සේවය කළේය. ශ්‍රී ලංකාව තුල ඖෂධ ප්‍රවාහනය කිරීම සම්බන්ධව මෑතකදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඖෂධ සම්බන්ධව රෙගුලාසියක් නිකුත් කර ඇත. එම රෙගුලාසියේ එක් ප්‍රතිපාදනයක් පහත පරිදි දැක්වේ,

*"සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලයලත් අධිකාරියක් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ ගත් බලයක් යටතේ මිස කිසිදු පුද්ගලයකුට ශ්‍රී ලංකාවේ පළාත් හරහා කිසිදු ඖෂධයක් වෙළඳාම් කිරීමට, බෙදා හැරීමට, රැගෙන යාමට හෝ ප්‍රවාහනය කිරීමට කිසිදු අවසරයක් නොමැත. බලපත්‍රයක් නොමැතිව එම ද්‍රව්‍ය වෙළඳාම් කිරීම, බෙදා හැරීම, රැගෙන යාම හෝ ප්‍රවාහනය කරන ඕනෑම පුද්ගලයකුට වසර දෙකක් දක්වා කාලයක් දීර්ඝ කළ හැකි සිරගත කිරීමකින් හෝ රුපියල් ලක්ෂයක් දක්වා වන දඩ මුදලකින් හෝ එකී දඬුවම් දෙකටම වරදකරුවකු ලෙස වගකීම පවරා අදාළ වරදට වරදකරු කළ හැකිය"*

මෙයට ආනුෂංගිකව මධ්‍යම හා දකුණු පළාත්වල ඖෂධ වෙළඳාම් කිරීමට හා බෙදාහැරීමට නිගම් විසින් බලපත්‍රයක් ලබා ගනී. එක් දිනක් ඔහු ගාල්ලේ සිට නුවර දෙසට කොළඹ හරහා ගමන් කරමින් සිටියදී දකුණු පළාතේ සීමාව වන බෙන්තොට පසු  කිරීමත් සමගම ඔහුගේ රථය පොලීසිය විසින් නවතන ලද අතර බලපත්‍රයක් නොමැතිව ඖෂධ ප්‍රවාහනයය කිරීම සම්බන්ධයෙන් ඔහුව අත්අඩංගුවට ගනී.

තැත් කිරීමට අදාළ නීතිය යොදා ගනිමින් නිගම්ගේ අපරාධ වගකීම සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකාවේ හා එංගලන්ත නීතියේ ඇති අදාළ  ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩුතීරණ උපයෝගී කරගනිමින් ඔබේ පිළිතුර ගොඩනගන්න. ශ්‍රී ලංකා නීතියට අවශ්‍ය සංශෝධන යෝජනා කරන්න.

05. (i). 'මරණ දඬුවම' ශ්‍රී ලංකාව තුළ පමණක් නොව අන්තර්ජාතික තලයේ ද විවාදයට ලක්ව ඇත. මේ සම්බන්ධ ප්‍රධාන ගැටළුව වන්නේ මරණ දඬුවම පැනවීම සඳහා නීතිය ප්‍රතිපාදනය දැක්විය යුතුද යන්න වන අතර ඒ හා සබැඳි අනෙකුත් ගැටලුව නම් නීතිය ඒ සඳහා ඉඩ ලබා දුන්නද එය ක්‍රියාත්මක කිරීම තෝරා ගැනීමක් මත (selective execution) සිදු විය යුතුද යන්නයි.

මරණ දඬුවම සම්බන්ධ පක්ෂ විපක්ෂ මත හා එබදු දණ්ඩනයක ප්‍රතිවිපාක දණ්ඩන න්‍යායන් ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය පිළිබිඹු කරමින් ඔබගේ තර්ක ගොඩ ගන්න.

(ii). සමාජය කිසිවෙකුටත් මත් වීම සඳහා උනන්දු නොකළද මත්වීම නිදොස් කර නිදහස් කිරීමේ (exculpatory defences) හෝ වගකීම ලිහිල් කිරීමේ (mitigatory defences) ව්‍යාතිරේඛයක් ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් නීතිය ඉතා ලිහිල් බවක් දක්වා තිබේ.
ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු ඇසුරින් උක්ත ප්‍රකාශය විවේචනය කරන්න.

06. ඔබ ශ්‍රී ලංකාවේ නීති කොමිසමේ, කොමසාරිස්වරයෙකු වශයෙන් පත්කර ඇතැයි උපකල්පනය කරන්න. ඔබට ලබාදී ඇති ප්‍රථම කාර්යය වන්නේ සමාන චේතනාව (similar intention) හා අනුබල දීම (abetment) සමග නිතරම ඇතිවන අපැහැදිලි තත්ත්වය හේතුවෙන් ව්‍යාකූලභාවයක් පවතින පොදු චේතනාව (common intention) සම්බන්ධ වන වර්තමාන නීතිය පිළිබඳ විශේෂඥ මතයක් ලියා ඉදිරිපත් කිරීමයි.

ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ වර්තමාන නීතිය ඇසුරෙන් විශේෂඥ මතයක් ලියා දක්වන්න.

07. (i). ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ සාපරාධී විශ්වාසය කඩ කිරීම ඔප්පු කිරීමට අවශ්‍ය මූලික අංග සාකච්ඡා කරන්න. විනිශ්චිත තීරණ ඇසුරින් ඔබේ පිළිතුර ගොඩනගන්න.

(ii). 2007 අංක වේ 24 දරණ පරිගණක අපරාධ පනත පැනවීම මගින් ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය නව තාක්ෂණික සොයාගැනීමක් කර ළඟා වූවා යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.
සාකච්ඡා කරන්න.